# <u>දැන්වීමයි</u>

**<u>කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී පාලි මණ්ඩපය.</u>**

වැවල - හොරණ

## <u>විශ්වවිද්‍යාල ප්‍රවේශය - කලා / එස්පී පාඨමාලාව - 2017/2018 අධ්‍යයන වර්ෂය</u>

### <u>ප්‍රසංග කලා / ජනමාධ්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලාව (සිංහල මාධ්‍යය) ඇතුළත්වීම සඳහා පෙනී සිටිය යුතු යෝග්‍යතා පරීක්ෂණය - 2018</u>

2017/2018 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති සහ මෙම මණ්ඩපයේ ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන්, 2018 යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට අමතරව මෙම යෝග්‍යතා පරීක්ෂණයටද අයදුම් කර පෙනී සිට ඉන් සමත් විය යුතුය.**

**01.** මෙම පාඨමාලාව පැවැත්වෙන්නේ **<u>සිංහල මාධ්‍යයෙන් පමණක්</u>** වන අතර පාඨමාලාවන් දෙක සඳහා අයදුම් කරන සියුන් වෙනුවෙන් ප්‍රායෝගික / වාචික හා සම්මුඛ පරීක්ෂණයක් හෝ අභියෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

**<u>02. යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය:</u>**

1. මෙහි සඳහන් ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුව පිළියෙළ කර ගත් අයදුම් පත්‍රය පමණක් භාවිත කළ යුතුය.

2. **ජනමාධ්‍ය සහ ප්‍රසංග කලා උපාධි පාඨමාලාවන් සඳහා වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, ප්‍රසංගකලා උපාධි පාඨමාලාව යටතේ ඇති විෂය ක්ෂේත්‍රයන් වන නර්තනය, සංගීතය, නාට්‍ය හා රංගකලාව, චිත්‍ර හා සැලසුම්කරණය සහ සිනමා අධ්‍යයනය සඳහාද වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.**

3. තවද සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පත සමඟ **<u>ඔබගේ නම හා ලිපිනය සහිත සෙ.මී. 10½ × 22½ ප්‍රමාණයේ රු: 35/- ක මුද්දර ගැසූ ලිපි කවරයක් ද අමුණා එවිය යුතුය.</u>**

4. යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් **රු: 800/- ක** මුදලක් ගෙවිය යුතුය. මෙම මුදල ලංකා බැංකුව හොරණ ශාඛාවේ ඇති අංක **719939** දරන රැස් කිරීමේ ගිණුමට බැර කිරීමට දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් සාමාන්‍ය පරිදි ගෙවීම් කළ හැකිය.

5. ගෙවීම් වවුචරයේ **<u>මුල් පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය.</u>**

6. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2018.02.02** දින හෝ එදිනට පෙර **සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය කටයුතු, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

7. මෙම යෝග්‍යතා පරීක්ෂණය හැකි ඉක්මණින් පැවැත්වීමට කටයුතු කරනු ලබන අතර, සුදුසුකම් ලබන අයදුම්කරුවන්ට යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය පෞද්ගලිකව දැන්වීමට කටයුතු කරනු ලැබේ.

**<u>සැ.යු:</u>** විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් නොමැතිව අයදුම් කරන අයදුම්කරුවන්ට ප්‍රවේශය නොලැබීම සම්බන්ධයෙන් මණ්ඩපය වගකියනු නොලබනු අතර, **අසම්පූර්ණ හා නියමිත දිනට පෙර එවා නොමැති අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු මොන යම් හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.**

**නිල වෙබ් අඩවිය : spc.cmb.ac.lk**

සහකාර ලේඛකාධිකාරී,
කොළඹ විශ්වවිද්‍යාලය,
ශ්‍රී පාලි මණ්ඩපය,
වැවල, හොරණ.

2018.01.09 දින.

දුරකථන අංක : 034 – 2263617 / 034 - 2265553 / 034 - 2261371